සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/4/LH/ Revolving Fund

ඔබේ අංකය / உமது இல / Your No: ....................

දිනය / திகதி / Date: 2016.09.06

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්,

දිවිනැගුම මුලස්ථාන කළමණාකරු / ව්‍යාපෘති කළමණාකරු.

**ව්‍යවස්ථාපිත අරමුදල් හා භාර අරමුදල් පිළිබඳ අවසාන වාර්තා ඉදිරිපත් කිරීම**

මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය චක්‍රීය අරමුදලෙහි වාර්ෂික ගිණුම් පිළියෙල කර මහා භාණ්ඩාගාරය වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PF/FD/04/198 දරණ ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

02. තවද, 2013 අංක 1 දරණ දිවි නැගුම පනතෙහි 37 වෙනි වගන්තිය ප්‍රකාරව දිවිනැගුම චක්‍රීය අරමුදල පිහිටුවනු ලැබිය යුතු වේ. ඒ සඳහා දැනට දිවිනැගුම ප්‍රජා මූල බැංකු මට්ටමෙන් ක්‍රියාත්මක ජීවනෝපාය චක්‍රීය අරමුදල පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගත යුතුව ඇත.

03. එබැවින් මේ සමග අමුණා ඇති ඇමුණුම් අංක 1 ආකෘතිය මගින් ප්‍රජා මූල බැංකු වෙතින් දත්ත ලබාගෙන ඇමුණුම් අංක 2 ආකෘතිය අනුව සකස් කළ වාර්තාව 2016.09.23 දිනට ප්‍රථම මා වෙත එවිය යුතු බව කාරුණිකව දන්වමි. අදාල තොරතුරු ඔබ කොට්ඨාශයට අයත් සියළු දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන්ගෙන් සහතික කරගෙන ඔබ ද පෞද්ගලිකව එම බැංකු වෙත ගොස් නැවත පරීක්ෂා කර බලා නිවැරදි බවට සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද සහිතව මෙම කාර්යාලයේ අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන) වෙත ෆැක්ස් අංක 011-2872201 මගින් එවිය යුතු වේ. තවද, එය divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ද යොමු කළ යුතු වේ.

04. දිස්ත්‍රික් වාර්තාව සකස් කර මා වෙත එවීම පිණිස අදාල වාර්තාවෙහි පිටපතක් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු බව අවධාරණය කරමි. ඒ අනුව එම වාර්තා ඒකාබද්ධ කර දිස්ත්‍රික් මට්ටමේ වාර්තාව 2016.09.30 දිනට පෙර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් මා වෙත එවනු ඇත.

j/jee/Ban/L.H.N.2016.09.06

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
011-2883802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
Fax -011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர்(நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax -011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
**011- 2887722(Hotline)**

05. මෙම තොරතුරු මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන බැවින් අදාල දත්ත සම්බන්ධ වාර්තා නිර්දේශ කරන, සහතික කරන, අනුමත කරන නිලධාරීන් වගකීමට බැඳෙන බැවින් මනා අවධානයකින් යුතුව අදාල වාර්තා ලබා දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම් - කා.දැ.ගැ.පි.
2. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ, ..................................

ඉහත වාර්තාව ඔබ වෙත ද ලබාගෙන දිස්ත්‍රික් මට්ටමේ වාර්තාව ඇමුණුම් අංක 3 අනුව සකස් කර 2016.09.30 ට පෙර ඉහත ෆැක්ස් අංකය හා විද්‍යුත් තැපැල මගින් මා වෙත එවන්න.